Education,Sabaragamuwa Province/ Weekly School Department of Education,Sabaragamuwa Province/ Weekly School Department of

**පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

සතිය- 11

විෂය:-නාට්‍ය හා රංග කලාව


Prepared by-කලාප අධ්‍යාපන කාර්යාලය, කෑගල්ල

ශ්‍රේණිය :- 11

# වේෂභූෂණ නිර්මාණය කිරීම

වේෂභූෂණ නිර්මාණයේ දී නාට්‍ය පෙළෙහි ශෛලිය විමසා බැලිය යුතුය.

- එම නාට්‍ය පෙළ ලෝක ධර්මී රංග ශෛලියට අයත් නම් නිර්මාණය කරනු ලබන වේෂභූෂණ සාමාන්‍ය ජීවිතයේ අඳින පළඳින ආකාරයට සමීප අයුරින් වේදිකාවට සරිලන ලෙස සකස් කළ යුතුය.



කැළණි පාලම නාට්‍යය




තලමල පිපිලා නාට්‍යය

- එම නාට්‍ය පෙළ නාට්‍යධර්මී රංග ශෛලියට අනුව සකස් කරන ලද්දක් නම් නිර්මාණය කරනු ලබන වේෂභූෂණ ස්වභාවිකත්වයෙන් ඈත්ව කාල්පනිකත්වයෙන් සහ අතිශයෝක්තියෙන් යුක්තව නිර්මාණය කළ යුතුය.

- එම නාට්‍ය පෙළ නාට්‍යධර්මී රංග ශෛලියට අනුව සකස් කරන ලද්දක් නම් නිර්මාණය කරනු ලබන වේෂභූෂණ ස්වභාවිකත්වයෙන් ඈත්ව කාල්පනිකත්වයෙන් සහ අතිශයෝක්තියෙන් යුක්තව නිර්මාණය කළ යුතුය.






රත්නාවලී නාට්‍යය

මනමේ නාට්‍යය





- නළුවා ගේ බාහිර සමාරෝපයටත්, අභ්‍යන්තර සමාරෝපයටත් වේෂභූෂණ ඉතා වැදගත් වේ. වේෂභූෂණ මඟින් දුටු පමණින් අපට චරිත හඳුනා ගැනීමේ හැකියාව ඇත. එමෙන්ම නළුවෙකුට හෝ නිළියකට තම චරිතයට අදාලව වේෂභූෂණවලින් සැරසීම මඟින් චරිතයට අභ්‍යන්තරිකව පිවිසීමේ උත්තේජනයක් ලැබේ. අප එදිනෙදා ජීවිතයේ දී වුව ද අවස්ථානුකූලව ඇඳුම් පැළඳුම් වෙනස් කරන විට ද මෙකී කාරණය අවබෝධ කර ගත හැක.

  උදාහරණ - පාසල් යන විට සිසු සිසුවියන් සුදු ඇඳුමින් සැරසීම

  පන්සල් යන විට සුදුසු පරිදි සුදු පැහැ වාම් ඇඳුමකින් සැරසීම

  මෙහි දී එම ඇඳුම්වලින් සැරසුණු විට අප ගේ භූමිකාව වෙනස් වන අතර අභ්‍යන්තරිකව එම චරිතයට ප්‍රවිශ්ට වී එහි ගති ලක්ෂණ විදහා පාන බව වටහා ගත හැක. අවස්ථානුකූල හැසිරීම්, ගමන බිමන, කතා බහ පවා වෙනස් වන බවත් එය එකිනෙකාට සාපේක්ෂ වුව ද බොහෝ සමාන ලක්ෂණ ඇති බවත් පෙනේ.

- වඩාත් උචිත ලෙසින් වේෂභූෂණ නිර්මාණය කිරීම නාට්‍යයේ සාර්ථකත්වයට හේතු වේ. ඒවා සැහැල්ලු ලෙස මෙන් ම ආලෝකකරණයේ දී ප්‍රේක්ෂකයාට මනා ප්‍රේක්ෂාවක් ලබා ගැනීමට බාධාකාරී නොවිය යුතුය. එනම් ඇසට අපහසුවක් නොවන පරිදි මෙන් ම නළුවා ගේ රූපණය පරයා යන ආකාරයෙන් නිර්මාණය නොකල යුතුය.

උදාහරණ ලෙස, බොහෝ දිලිසෙන වස්ත්‍රාභරණ වේදිකා ආලෝකය මත පතිත වීමේ දී ප්‍රේක්ෂාවට බාධා වේ. සැහැල්ලු රෙදි වර්ග හා අමුද්‍රව්‍ය යොදා ගනිමින් නිර්මාණය කළ යුතුය. ( කොට්න්, වොයිල්, සෙටින්, කාඩ්බෝඩ්, රේන්ද, පබළු ආදිය මේ සඳහා යොදා ගත හැක.)

- නළුවෙකු නිරූපණය කරන භූමිකාව පිළිබඳ දෘශ්‍ය සංඥා රැසක් එම නළුවා ගේ වේෂභූෂණයෙන් අනාවරණය වේ.



මනමේ නාට්‍යය



සිංහබාහු නාට්‍යය

- රට, ප්‍රදේශය හා සංස්කෘතිය වේෂභූෂණ වලින් පිළිබිඹු විය යුතුය.

විවිධ රටවල් අනුව ද ජාතීන් අනුව ද සංස්කෘතිකමය වශයෙන් ද වේෂභූෂණ වෙනස් වේ. එවිට ඒවාට හානි නොවන ලෙසත් අදාල ලෙසත් නිර්මාණය කර ගත යුතුය.

- ප්‍රධාන වශයෙන් ම පෙළෙහි එන චරිතයන්ට උචිත ම අයුරින් වේෂභූෂණ නිර්මාණය කළ යුතුය.

- නළුවා ගේ රංගන කාර්යයට පහසු ආකාරයෙන් මෙන්ම ඇතැම් විට නාට්‍ය රඟ දැක්වෙන අතරතුර වේෂභූෂණ මාරු කිරීමට ඇත්නම් ඒ සඳහා හැකි වන පරිදි ඒවා නිර්මාණය කළ යුතුය.

- නාට්‍ය ශෛලිය හා ඉන් මතු කෙරෙන මනෝභාවය පිළිබඳව වේෂභූෂණ නිර්මාණ ශිල්පියා තුළ අවබෝධයක් තිබිය යුතුය.

- ඓතිහාසික යුගයේ චරිත සඳහා වේෂභූෂණ නිර්මාණය කරන්නේ නම් අදාළ යුගයේ වස්ත්‍රාභරණ පිළිබඳ ව මනා අධ්‍යයනයක් කළ යුතුය.

උදාහරණ,

වර්තමානයේ පටන් අනුරාධපුර, පොළොන්නරු, යාපහු ආදී යුගයන්වල මෙන් ම ගල් යුගය, දඩයම් යුගය ආදි ඈත අතීතයේ දක්වා විමසීමේ දී කලින් කලට ඇඳුම් පැළඳුම්වල වෙනස්කම් හා ආවේණික ලක්ෂණ ඇත. ඒවා දේශීය හා විදේශීය වශයෙන් ද විවිධාකාර වේ. ඒ පිළිබඳ අධ්‍යයනය කරමින් වේෂභූෂණ එම චරිතවලට නිර්මාණය කල යුතුය.

- චරිතයක් හඳුනා ගැනීමට, චරිතයක වයස අනාවරණය කර ගැනීමට, රසවින්දනයට, විශ්වාසනීයත්වයට මෙන්ම චරිතයක ගති ලක්ෂණ ඉස්මතු වී පෙනීමට ද වේෂභූෂණය හේතු වේ.
- එමෙන් ම චරිතයක මානසික ස්වභාවය ඉස්මතු කර දැක්වීමට ද වේෂභූෂණ උපකාරී වේ.

මෙහි දී ද පිළිවෙල හෝ අපිළිවෙල මත ,නොමැති නම් වේෂභූෂණ පැළඳ ඇති ආකාරය අනුව චරිතය හොඳ මානසික මට්ටමකින් පසුවනවා ද අවුල් සහගත මානසික මට්ටමකින් පසුවනවා ද යන්න පිළිබඳ වටහා ගත හැකිය.



හුණුවටය නාට්‍යය



හුණුවටය



මනමේ නාට්‍යය




සිංහබාහු නාට්‍යය

- රට, ප්‍රදේශය හා සංස්කෘතිය වේෂභූෂණ වලින් පිළිබිඹු විය යුතුය.

විවිධ රටවල් අනුව ද ජාතීන් අනුව ද සංස්කෘතිකමය වශයෙන් ද වේෂභූෂණ වෙනස් වේ. එවිට ඒවාට හානි නොවන ලෙසත් අදාල ලෙසත් නිර්මාණය කර ගත යුතුය.

- ප්‍රධාන වශයෙන් ම පෙළෙහි එන චරිතයන්ට උචිත ම අයුරින් වේෂභූෂණ නිර්මාණය කළ යුතුය.
- නළුවා ගේ රංගන කාර්යයට පහසු ආකාරයෙන් මෙන්ම ඇතැම් විට නාට්‍ය රඟ දැක්වෙන අතරතුර වේෂභූෂණ මාරු කිරීමට ඇත්නම් ඒ සඳහා හැකි වන පරිදි ඒවා නිර්මාණය කළ යුතුය.







ආලෝකය ද්‍රව්‍ය හා පෘෂ්ඨ මත පතිත වීමේ දී ඒවා යේ වර්ණ පරාවර්තනය වී වෙනස් වේ. ඒ සඳහා ආලෝක වර්ණ සුසංයෝජනය හා පෘෂ්ට වල වර්ණ සුසංයෝජනය බලපානු ලැබේ. එම නිසා වේෂභූෂණ නිර්මාණය කරන විට මෙම වර්ණ ගැලපීම් හා සුසංයෝජන පිළිබඳ මනා අවබෝධයකින් එය සිදු කළ යුතු වේ.

හෙන්රික් ඉබ්සන් ගේ **doll's house** නාට්‍යයේ වේෂභූෂණ සැලසුම් කිහිපයක්



නෝරාගේ චරිතය




ලින්ඩේ මිය ගේ චරිතය

ඇගයීම: 1. පහත දැක්වෙන චරිත සඳහා රංග වස්ත්‍රාභරණ ආකෘතීන් නිර්මාණය කරන්න.

- රජ කෙනෙක් (නාට්‍යධර්මී)
- දුප්පත් මහළු කාන්තාවක් (ලෝකධර්මී)
- නරි බෑණා නාට්‍යයේ නරියා ගේ චරිතය

(මේ සඳහා රෙදි කැබලි, නූල්, ඉදිකටු, ගම්, කතුරු වැනි පහසුවෙන් සපයාගත හැකි ද්‍රව්‍ය යොදා ගන්න.)

2. ඔබ නරඹා ඇති නාට්‍යයක වේෂභූෂණ නිර්මාණය කර තිබූ ආකාරය පාඩමෙහි කරුණු සැලකිල්ලට ගනිමින් විස්තර කරන්න.